සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளீர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/14/16/Circular/Asva/2023 ....

ඔබේ අංකය / உமது இல / Your No: ....

දිනය / திகதி / Date: 2023.09.26 ....

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් ලේකම්වරු,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන්

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්

සියළුම නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂවරු /සහකාර සමෘද්ධි අධ්‍යක්ෂවරු

සියළුම සමෘද්ධි කළමණාකරුවන් / ප්‍රවර්ධන නිලධාරින්

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින්

අස්වැසුම සුභසාධක ප්‍රතිලාභීන් වෙනුවෙන් සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාලව සමාජ ආරක්ෂණ ජාල වැඩසටහනට දායක කර ගැනීමේ හා ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදය

2023.04.21 දිනැති අංක 2328/13 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් කිරීම මේ වන විට ආරම්භ කර ඇත. මෙම ගැසට් නිවේදනයට පාදක වූ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයෙ 9 ඡේදයේ (ආ) වගන්තිය අනුව **දැනට ක්‍රියාත්මක වන තෝරාගත් සුභසාධන යෝජනා ක්‍රම සකස් කිරීමට** යෝජනා කර ඇති අතර හා එහි 10. ඡේදයේ, xii වගන්තිය අනුව **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය ලෙස ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය නිශ්චිත කාල රමුවකට අනුව සිදු කිරීමට** අනුමැතිය ලබා දී ඇත.

02. එමෙන්ම, 2013 අංක 01 දරණ දිවි නැඟුම පනත ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී ප්‍රධාන පරමාර්ථයන් ලෙස **දිළිඳු බව තුරන්කර සමාජ සාධාරණත්වයක් ඇති කරලීම සඳහා පුද්ගලයා, පවුල, කණ්ඩායම සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහනක් හා ශක්තිමත් සමාජ ආරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම** දක්වා ඇත.

03. ඒ අනුව මේ වන විටත් මෙම දෙපාර්තමේන්තුව විසින්, සමාජ ආරක්ෂණ වැඩසටහන, නිවාස ලොතරැයි වැඩසටහන හා අනිවාර්ය ඉතුරුම් වැඩසටහන යන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් ගේ කැමැත්ත මත අයකර ගන්නාලද දායක මුදලින්, අරමුදල් 03ක් පවත්වාගෙන යනු ලබයි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2872202
Fax - 011-2889002
E-mail- dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / **பிரதான கணக்காளர்** / Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director (Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / **அலுவலகம்** / Office
0112872202
Hot Line: 011- 2887722

04. අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම ආරම්භ වන තෙක් සමෘද්ධි සහනාධාර මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා සමෘද්ධි බැංකු මඟින් ප්‍රතිලාභියාට ගෙවනු ලැබූ අතර, අදාල දායක මුදල් ප්‍රතිලාභියාගේ එකඟතාවය මත සහනාධාර මුදලින් අඩු කර දෙපාර්තමේන්තු සතු අදාල අරමුදල් ගිණුම් වලට බැර කරන ලදී.

05. අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ක්‍රමවේදය ක්‍රියාත්මක වීමත් සමඟ සහනාධාර ලබා දීමේ ක්‍රියාවලිය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ඉවත් වුවද, සමාජ සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාත්මක කරන අතර, ඉලක්කගත ප්‍රජාව ලෙස අස්වැසුම ප්‍රතිලාභින් ඇතුලත් වීම සිදු වී ඇත. එබැවින් මෙතෙක් ක්‍රියාත්මක කරන ලද සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන් ද ඒ අයුරින්ම ක්‍රියාත්මක කල යුතුවේ.

06. සමාජ සවිබල ගැන්වීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් ලෙස සමාජ ආරක්ෂණ ජාලයක් ඇති කිරිම සැලකිය හැකිය. දෙපාර්තමේන්තුව තුළ මේ වන විටත් සාර්ථක හා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක අතර, රක්ෂණ වැඩසටහන, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන, නිවාස ලොතරැයි වැඩසටහන හා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ඒ අතර ප්‍රමුඛ වේ.

07. ඒ අනුව, අස්වැසුම ප්‍රතිලාභින්ට සමාජ ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අස්වැසුම ප්‍රතිලාභින් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා ඒ සඳහා ඔවුන් දායක කර ගැනීම සිදු කල යුතුව ඇත.

08. ප්‍රතිලාභින් තම ස්වකැමැත්ත මත එක් එක් වැඩසටහනට මාසික දායකත්වය පහත පරිදි ලබා දිය යුතුය. ඒ සඳහා මාසිකව අස්වැසුම ප්‍රතිලාභ මුදල් බැර වන ඉතිරි කිරීම් ගිණුමෙන් අඩු කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස අදාල බැංකු වෙත ලිඛිතව ස්ථාවර නියෝගයක් (standing order) ලබා දීමට ප්‍රතිලාභියා එකඟ විය යුතුය.

<table>
<tr><th>ප්‍රතිලාභි සමාජ කාණ්ඩලය</th><th>සමාජ ආරක්ෂණ දායක මුදල (රු)</th><th>නිවාස ලොතරැයි දායක මුදල (රු)</th><th>අනිවාර්ය ඉතිරි දායක මුදල (රු)</th></tr>
<tr><td>දුප්පත්-සාමාජික 2 ට වැඩි</td><td>200</td><td rowspan="2">100</td><td>400</td></tr>
<tr><td>දුප්පත් - සාමාජික 2 හෝ 2කට අඩු</td><td>150</td><td>300</td></tr>
<tr><td>අන්ත දුප්පත්</td><td>200</td><td>100</td><td>400</td></tr>
</table>

09. සමාජ ආරක්ෂණ වැඩසටහන අස්වැසුම ප්‍රතිලාභින් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත ක්‍රමවේදය අනුගමන කල යුතු වේ.

9-1. අස්වැසුම ප්‍රතලාභින්ගේ එකඟතාවය ලබා ගැනීම

i. මෙම සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වැඩසටහනට, අස්වැසුම ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩ අතුරින් දුප්පත් හා අන්ත දිළිඳු සමාජ කාණ්ඩයම් ආරම්භක පියවර ලෙස දායක කර ගැනීම අපේකෂා කරමි.

ii. ඒ අනුව, බැංකු සමිති කළමණාකරු විසින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙතින්, ඉහත සමාජ කණ්ඩවලට අයත් අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ හිමි පවුල් වල නාමලේඛන, පහත සඳහන් කරුණු වලට අදාලව ලබා ගැනීම හා එම තොරතුරු ඇතුලත් නාම ලේඛන සමෘද්ධි බැංකු මට්ටමට වෙන් කර අදාල සමෘද්ධි බැංකුව වෙත යොමු කිරීම.

- අස්වැසුම ප්‍රතිලාභියාගේ/ ගිණුම් හිමියාගේ නම
- අස්වැසුම ප්‍රතිලාභියාගේ/ ගිණුම් හිමියාගේ ජාතික හැඳුනුම්පත් අංකය
- ස්ථිර ලිපිනය
- අස්වැසුම සමාජ කාණ්ඩය
- අස්වැසුම ප්‍රතිලාභ බැර වන ඉතිරි කිරිමේ ගිණුම අයත් බැංකුව, බැංකු ශාඛාව හා ගිණුම් අංකය
- පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව

iii. සමෘද්ධි බැංකු කළමණාකරු විසින් සමෘද්ධි බැංකු සමිතිය වෙතින් ලබාදුන් තොරතුරු ඇතුලත් නාමලේඛනය වසම් මට්ටමට වෙන් කර වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා වෙත ලබා දීම. ඇමුණුම - 01 පෝරමයේ පිටපත් ලබා දීම සිදු කල යුතුය.

iv. වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා විසින්, නාමලේඛනයේ නම සඳහන් ප්‍රතිලාභීන්ගෙන් ඇමුණුම 01 පෝරමය නිවැරදිව සම්පූර්ණ කරවාගෙන ඔවුන්ගේ එකඟතාවය සහිතව අත්සන ලබා ගැනීම හා නිවැරදි බවට තහවුරු කර අත්සන් කර සමෘද්ධි බැංකුව වෙත භාර දීම.

v. අදාල අයදුම්පත්‍ර වල ප්‍රතිලාභී තොරතුරු සමෘද්ධි බැංකු කළමණාකරු විසින් ලේඛන සමඟ පරික්ෂා කර නිවැරදි බවට සහතික කර අස්වැසුම ප්‍රතිලාභී නාම ලේඛනයේ අනුපිළිවෙලින් පිළියෙල කරන ලද අයදුම්පත් සමෘද්ධි බැංකු සමිති කළමණාකරු වෙත භාරදීම සිදු කල යුතුය.

9-2. එක් එක් අරමුදල් සඳහා දායක මුදල් ලබා ගැනීම

i. මේ වන විටත්, අස්වැසුම් ප්‍රතිලාභ බැර කරන වානිජ බැංකු සමඟ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සාකච්ඡා කර එකඟතාවයන්ට පත්ව ඇත. ඒ අනුව, අස්වැසුම ප්‍රතිලාභින්ගේ ස්ථාවර නියෝගයන් පරිදි අදාල දායක මුදල් ලබා දීම සම්බන්ධයෙන් වානිජ බැංකු ප්‍රධාන කාර්යාල මඟින් තම බැංකු ශාඛා දැනුවත් කරන ලෙසට ලිඛිතව දැනුම් දෙනු ලබයි.

ii. ඒ අනුව ඉහත 9-1 ඡේදය පරිදි මනාපය ප්‍රකාශ කර ඇති ප්‍රතිලාභීන්ගෙන් ඒ ඒ අරමුදල් සඳහා සහනාධාර මුදලින් අය විය යුතු ප්‍රමාණයන් අදාල අරමුදල් ගිණුම් වලට බැර කිරීම සඳහා වන මුදල් ප්‍රේෂණ පත්‍ර (Slip) සමෘද්ධි බැංකු සමිති කළමණාකරු විසින් වෙන වෙනම සකස් කර අස්වැසුම ප්‍රතිලාභ ලබාදෙන බැංකු 04 වෙත ඉදිරිපත් කිරීම. (ප්‍රේෂණ පත්‍ර ක්‍රමවේදයට අමතරව එක් එක් වානිජ බැංකු එකඟවන ක්‍රමයකට අනුව අදාල දායක මුදල් අය කර ගැනීමේ ක්‍රමවේද අනුගමනය කිරිමේ බලය බැංකු සමිති කළමණාකරු වෙත හිමි වේ.)

iii.

ගිණුම් තැබීම - දායක මුදල් රැස් කිරීම

1.	ජංගම ගිණුම	හර	
	සමාජ ආරක්ෂණ/ නිවාස ලොතරැයි/අනිවාර්යය ඉතිරි තැන්පත් අරමුදල් සඳහා ප්‍රතිලාභි දායක මුදල් රැස් කිරීමේ ගිණුම	බැර	(කේත අංකය -9427)
2.	රැස්කල දායක මුදල් අදාල අංශ වලට යැවීම		
	සමාජ ආරක්ෂණ/ නිවාස ලොතරැයි/අනිවාර්යය ඉතිරි තැන්පත් අරමුදල් සඳහා ප්‍රතිලාභි දායක මුදල් රැස් කිරීමේ ගිණුම	හර	
	ජංගම ගිණුම	බැර	(සමෘද්ධි දිස්ත්‍රික් අංශයට)
	ආයෝජනය සඳහා සමෘද්ධි බැංකු වලින් ලද අරමුදල් ගිණුම	බැර	අනිවාර්ය ඉතිරි කිරීම් වලට රැස්කල මුදල්

ඉහත ගිණුම් සටහනේ, ජංගම ගිණුමේ සටහන් කරනු ලැබුවේ, සමාජ ආරක්ෂණ හා නිවාස ලොතරැයි වැඩසටහන් සඳහා රැස්කල දායක මුදල් දිස්ත්‍රික් සමෘද්ධි අංශට යවන ලද මුදල වේ.අදාල වැඩසටහන් සඳහා මුදල් මාරුකල පසු දායක මුදල් රැස්කිරීමේ ගිණුම ශුන්‍ය වේ.

iv. සමෘද්ධි බැංකු සමිති විසින්, අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පත් දායක මුදල් ඒ ඒ බැංකුව නමින් ආයෝජනය කර, අදාල තොරතුරු හා ආයෝජන නිවේදන ලබා දීම නියමිත පරිදි සිදු කල යුතුය.

v. වානිජ බැංකු වෙත ඉදිරිපත් කරනු ලබන ප්‍රේෂණ පත්‍ර හා අනෙකුත් ක්‍රමවේදවලට අනුව ඔවුන් විසින් සමාජ ආරක්ෂණ අරමුදලට, සමෘද්ධි නිවාස අරමුදලට හා අනිවාර්යය ඉතුරුම් අරමුදල අදාලව ප්‍රතිලාභි දායකත්ව මුදල තනි මුදලක් ලෙස අදාල සමෘද්ධි බැංකු සමිති ගිණුමට එවනු ලබයි.

vi. බැංකු සමිති කළමණාකරු විසින් එම මුදල අදාල ලේඛණ අනුව, අරමුදල් වලට වෙන් කර වෙන වෙනම ලේඛණ සකස් කර, දිස්ත්‍රික් කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත එවිය යුතු අතර, එම මුදල් දිස්ත්‍රික් අංශයේ පවතින ක්ෂුද්‍ර මූල්‍ය ගිණුමට වෙත බැර කල යුතුය. (ඇමුණුම 02)

vii. දිස්ත්‍රික් වෙත එවනු ලබන මෙම මුදල් බැංකු විෂය කළමණාකරු විසින් අදාල අරමුදල් අනුව වෙන් කර, ප්‍රධාන කාර්යාලයේ අදාල අරමුදල් ගිණුම් වලට බැර කල යුතු වේ.(ඇමුණුම -03-I හා 03- II) මෙම කටයුතු සඳහා නිවාස ලොතරැයි හා සමාජ ආරක්ෂණ විෂය භාර නිලධාරීන්ගේ සහාය ලබා ගත යුතුවේ.

9-3. සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

i. අරමුදල් වලට දායකත්ව දක්වන ලද අස්වැසුම ප්‍රතිලාභින්ගේ නාම ලේඛන බැංකු සමිති කළමණාකරු විසින් අදාල සමෘද්ධි බැංකු වෙත ලබා දීය යුතුය. ඒ අනුව සම්පූර්ණ කරන ලද අස්වැසුම ප්‍රතිලාභි හිමිකම් පතක් පිටපත් දෙකකින් සකස් කර, එක් පිටපතක් අදාල ප්‍රතිලාභියා වෙත හා අනෙක් පිටපත සමෘද්ධි බැංකුවේ ගොනුගත කල යුතුය. අනතුරුව වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අයදුම්පත් ලබාගෙන නිසි පරිදි බැංකු වෙත ඉදිරිපත් කල යුතුය.

ii. ගෙවීම්වලට අදාල වවුචර්පත් කලාප සහකාර විසින් නිර්දේශ කිරීම, බැංකු සමිති කළමණාකරු විසින් අනුමත කිරීම හා බැංකු කළමණාකරු විසින් සහතික කර ගෙවීම් සිදු කිරීම. අනතුරුව අදාල වර්ගීකරණ ලේඛනද සමඟ ප්‍රතිපූර්ණය කිරීම සඳහා බැංකු සමිති හරහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම සිදු කල යුතුය. මේ සම්බන්ධයෙන් උපදෙස් සහිත චක්‍රලේඛ ලිපියක් ඉදිරියේ දී ඔබ වෙත යොමු කරනු ඇත.

10. ඉහත ක්‍රමවේදයන් අනුගමනය කර සැප්තැම්බර් මසට අදාලව සමාජ ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පහත කාල රාමුව තුල සිදු කිරීමට කටයුතු කල යුතු වේ.

i. බැංකු සමිති විසින් සුහසාධක ප්‍රතිලාභ හිමි පවුල්වල නාමලේඛන සමෘද්ධි බැංකුව වෙත යොමු කිරීම.	2023.10.16 දිනට පෙර
ii. සමෘද්ධි බැංකු විසින් තොරතුරු ඇතුලත් නාමලේඛන වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා වෙත ලබා දීම.	2023.10.23 දිනට පෙර
iii. වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා විසින් ඇමුණුම 01 පෝරමය නිවැරදිව සම්පූර්ණ කරවාගෙන ඔවුන් ගෙන් ලබාගත් එකඟතාවය සමෘද්ධි බැංකුව වෙත භාර දීම.	2023.11.01 දිනට පෙර
iv. සමෘද්ධි බැංකු විසින් අදාල පෝරමයන් ප්‍රතිලාභී නාම ලේඛන සමඟ අනුපිළිවෙලින් සකසා අදාල සමෘද්ධි බැංකු සමිති කළමණාකරු වෙත භාරදීම.	2023.11.08 නට පෙර
v. සමෘද්ධි බැංකු සමිති විසින් අදාල වානිජ බැංකු සමඟ නිරතුරුවම සම්බන්ධ වෙමින්, සාකච්ඡා කර එකඟතාවයන්ට පැමිණ, සැප්තැම්බර් මාසයට අදාල ප්‍රතිලාභ වානිජ බැංකු වෙත බැර කිරිමට පෙර අදාල බැංකු වෙත සකස් කරන ලද ප්‍රේෂණ පත්‍ර ලබා දීම හෝ බැංකුව විසින් එකඟවන ක්‍රමයකට අදාලව කටයුතු කිරිම.	
vi වානිජ බැංකු විසින් බැංකු සමිති ගිණුම් වෙත මුදල් බැර කිරීමෙන් අනතුරුව දින 07ක් ඇතුලත දිස්ත්‍රික් කාර්යාල ගිණුමට මුදල් බැර කිරීම.	
vii. දිස්ත්‍රික් කාර්යාලය විසින් දින 7ක් අතුලත අදාල තොරතුරු සමඟ එම මුදල් ප්‍රධාන කාර්යාල අරමුදල් ගිණුම් බවට බැර කිරිම	

10. ප්‍රතිලාභින්ගේ ඉල්ලීම් ලැබෙන පරිදි ඉදිරියට ගෙවීම් කටයුතු කඩිනමින් සිදු කල යුතු වීම.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්,කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස./ දැ.ගැස

ඇමුණුම - 01

අධ්‍යක්ෂ ජනරාල්,

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්.තුව

සමාජ ආරක්ෂණ, නිවාස ලොතරැයි, අනිවාර්ය ඉතිරි කිරීම් වැඩසටහන් සඳහා ප්‍රතිලාභි දායක කර ගැනීමේ අයදුම්පත

1. සම්පූර්ණ නම

i. ප්‍රතිලාභියා	ii. ගිණුම් හිමියා

2. ජාතික හැඳුනුම්පත් අංකය

3. ස්ථිර ලිපිනය

4. දුරකථන අංක

5. සමෘද්ධි බැංකුව හා ග්‍රාම නිලධාරි වසම

6. අස්වැසුම ලැබීමට පෙර සමෘද්ධි ප්‍රතිලාභියෙක්ද යන වග

7. අස්වැසුම සමාජ කාණ්ඩය (අදාල කාණ්ඩය ඉදිරියෙන් ඇති කොටුවේ √ ලකුණ යොදන්න)

දුප්පත්	
අන්තදුප්පත්	

8. අස්වැසුම ප්‍රතිලාභ බැර වන ගිණුමේ තොරතුරු

බැංකුව	ශාඛාව	ගිණුම් අංකය

9. පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව

(පවුල ලෙස අර්ථ දක්වන්නේ මව, පියා සහ අවිවාහක දරුවන් පමණි.විවාහක දරුවන් හෝ වෙනත් ඥාතීන් එකම නිවසක වාසය කළද එම පිරිස් "පවුල" යන අර්ථකතනයට ඇතුලත් නොවේ.)

නම	ඥාතීත්වය	උපන් දිනය	රැකියාව

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් දන්වා සිටිමි.

....

දිනය ප්‍රතිලාභි අත්සන

10. වැඩසටහන් සඳහා මාසික දායකත්වය ලබා ගැනීමට එකඟතාවය ලබා ගැනීම

වැඩසටහන	මාසික දායක මුදල (රු)	එකඟතාවය
i. සමාජ ආරක්ෂණ වැඩසටහන		
ii. නිවාස ලොතරැයි වැඩසටහන		
iii. අනිවාර්යය ඉතිරි තැන්පත් වැඩසටහන		
එකතුව		

ඉහත 10. යටතේ i, ii, iii අනු අංක මඟින් දක්වා ඇති වැඩසටහන් සඳහා දායකත්වය ලබා ගැනීමට හා එම වැඩසටහන් මගින් ලබාදෙන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබීමට මා කැමැත්ත ප්‍රකාශ කරන අතර,..................................බැංකුවේ ....ශාඛාවේ ....ගිණුම් අංක යටතේ පවතින මාගේ ඉතිරි කිරීමේ ගිණුමට බැර වන මාසික අස්වැසුම ප්‍රතිලාභ මුදලින් ඉහත වැඩසටහන සඳහා රු.................... ක මුදල මාසිකව අය කර ගැනීමට මාගේ /අපගේ එකඟතාවය මෙයින් පල කරමි. /කරමු.

දිනය ....   දිනය ....

ප්‍රතිලාභියාගේ අත්සන.............................   ගිණුම් හිමියාගේ අත්සන.............................

	නම	අත්සන	දිනය
වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියා	....	....	....
සමෘද්ධි බැංකු කළමණාකරු	....	....	....
සමෘද්ධි බැංකු සමිති කළමණාකරු	....	....	....

පිටපත් - බැංකු කළමණාකරු, සමෘද්ධි බැංකුව, ...

ඇමුණුම - 02

දිනය............................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
....

... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 20..... .... මාසයට අදාලව දායක මුදල් බැර කිරීම.

2023 .... මාසයට අදාලව බැංකු වෙතින් අප ප්‍රජා මුල බැංකු සමිතියේ ගිණුම් අංක...................... දරන ගිණුමට බැර කර ඇති දායක මුදල් දිස්ත්‍රික් කාර්යාලයේ ගිණුම් අංක ....දරන ගිණුමට බැර වන සේ රු. .... (රු.............../-) ක මුදලක් අංක ....දරන චෙක්පතකින් මේ සමඟ එවන බව කාරුණිකව දන්වමි.

එම මුදල් ලැබුණු බවට තහවුරු කර මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එවනු ලබන මුදල් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අනු අංකය	බැංකුවේ නම	සමාජ ආරක්ෂණ වැඩසටහන		නිවාස ලොතරැයි වැඩසටහන		අනිවාර්යය ඉතිරි කිරීම් වැඩසටහන		එකතුව	
		ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)	ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)	ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)	ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)
	ලංකා බැංකුව								
	මහජන බැංකුව								
	ජාතික ඉතිරි කිරීම් බැංකුව								
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව								
	එකතුව								

සකස් කළේ:- .... පරික්ෂා කලේ:...

සහතික කලේ

....
ප්‍රාදේශීය ලේකම්

ඇමුණුම - 03 -I

දිනය.....................

අධ්‍යක්ෂ ජනරාල්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

.. දිස්ත්‍රික්කයේ 20..... .... මාසයට අදාලව දායක මුදල් බැර කිරීම.

2023 .... මාසයට අදාලව සමෘද්ධි ප්‍රජා මුල බැංකු සමිති වෙතින් අප දිස්ත්‍රික්කයේ ගිණුම් අංක..................... දරන ගිණුමට බැර කර ඇති දායක මුදල් සමෘද්ධි සංවර්ධන දොපර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන අරමුදල් ගිණුමවලට බැර වන ලෙස පහත සඳහන් පරිදි චෙක්පත්, මේ සමඟ එවන බව කාරුණිකව දන්වමි.

.

වැඩසටහන අයත් ගිණුමේ නම	ගිණුම් අංකය	චෙක්පත් අංකය	දිනය	බැර කල මුදල (රු)
සමාජ ආරක්ෂණ අරමුදල				
නිවාස ලොතරැයි අරමුදල				
අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල				

සකස් කළේ:- .... **පරික්ෂා කලේ:..**

සහතික කලේ

....

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

... දිස්ත්‍රික්කයේ 20..... .... මාසයට අදාලව දායක මුදල් බැර කිරීම.

පහත වැඩසටහන් සඳහා ලැබුණු දායක මුදල ප්‍රාදේශිය ලේකම් කාර්යාල/සමෘද්ධි බැංකු සමිති මට්ටමින් පහත පරිදි වේ.

අනු අංකය	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය/ සමෘද්ධි බැංකු සමිතිය	සමාජ ආරක්ෂණ අරමුදල		නිවාස ලොතරැයි අරමුදල		අනිවාර්යය ඉතිරි කිරීම් අරමුදල		එකතුව	
		ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)	ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)	ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)	ප්‍රතිලාභි සංඛ්‍යාව	මුදල (රු)
	එකතුව								

සකස් කළේ:- .... පරික්ෂා කලේ:...

සහතික කලේ

....
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ